දෙවර්ෂ පූර්ණ සැමරුම!

# අපේ විත්ති

## සංස්කෘතික අධ්‍යාපන කේන්ද්‍රය

සංස්කෘතික අධ්‍යාපන කේන්ද්‍රයට පුරා වසර දෙකක් සම්පූර්ණ විය. අපි තුන් වෙනි වසරට පා තබා සිටිමු. පසුගිය වසර දෙක පුරා අප ලැබූ ප්‍රගතිය සමස්ථයක් වශයෙන් ඔබ වෙත ගෙන ඒම සඳහා "අපේ විත්ති" දොරට වැඩම වීමට අපි අදහස් කොළෙමු.

අපේ මවුබිමෙන් ඈතෙරව සිටියත් අපේ දරුවනට අපේ භාෂාව, අපේ උරුමය සහ සංස්කෘතිය ලබාදී ඔවුන් තුළ "අපේ කම" ඇති කරමින් නවීන විනයානුකූල පුංචි පරපුරක් සාඩම්බරයෙන් බිහිකිරීම අපේ ප්‍රාර්ථනාවයි.

අපේ අභිලාෂය විශයයන් බවට පරිවර්තනයවී අපේ දරුවනට ලබාදෙනු වස් සෑම සිකුරාදාවකම සිය වටිනා කාලයත්, ශ්‍රමයත් කැපකර ගුරු මණ්ඩලයත්, සංවිධායක කමිටුවත් අපරිමිත උත්සාහයක යෙදී සිටී. අපි ඔබ සැම අත්වැල් බැඳ ගනිමු. අපේ දරුවන් සමග ඉදිරියටම යමු. අපේ කම රැක ගනිමු.

## සාදරයෙන් පිළිගනිමු

කෙටි නිවාඩුවකින් පසු පාසැල වෙත පැමිණි සංස්කෘතික අධ්‍යාපන කේන්ද්‍රයේ සියලුම සිසු දරුදැරියන්ද, ගුරු මණ්ඩලයද, නවක සිසු දරුදැරියන හා ගුරුවරියන්ද 2003 වර්ෂය සඳහා හදපිරි ආදරයෙන් පිළිගනිමු.

## 2003 නව වසර

පසුගිය වසර අවසානයේ පැවැත්වූ ඇගයීමේ පරීක්ෂණයෙන් පසු සිසු දරුදැරියන්ගේ පංති උසස් කිරීමක් සිදුකල අතර තව දුරටත් දැනුම අවශ්‍ය දරුවන් ගුරුවරුන්ගේ තීරණය මත එම පංතියේම නතර කර ගන්නා ලදී.

සියලුම දරු දැරියන් ඉතා උනන්දුවෙන් සිය වැඩ කටයුතු කරගෙන යන අයුරු බලා අපි සතුටු වෙමු. පසුගිය වසර තුල ලමුන් ලබාගෙන ඇති ප්‍රගතිය ගුරුවරුන්ගේ අමන්දානන්දනයට හේතුවිය.

## 2002 වසරේ මතක සටහන්

ළමයින්ගේ දැනුම පොත පතට පමණක් සීමා නොකර අභ්‍යාස මගින් දැනුම වර්ධනය කිරීම සඳහා "අපේ උරුමය" විෂයට අදාලව අපේ රටේ විශේෂ ජාතික උත්සව කිපයක් වෙනුවෙන් ළමයින් ඉදිරිපත් කර ඔවුන්ට දැනුමත් ව්‍යනෝදාශ්වාදයත් ගෙනදීමට අපි උත්සාහ කොළෙමු. ඒ අතර පසුගිය නිදහස් උත්සවය ඉතා උසස් මට්ටමකින් "අල්නසර්" රංගන ශාලාවේදී ඉදිරිපත් කිරීමට අපි සමත් වූයෙමු. නවද සිංහල අළුත් අවුරුදු උත්සවය සියලුම සිරිත් විරිත් සිදුකරමින් ලමුන් සමඟ ගතකර විශාල දැනුමක් ඔවුන්ට ලබා දුන්නෙමු. "බක් මහ අසිරිය" රබන් හඬ මැද්දේ ඒ සියළු දෙනාම සැබවින්ම රස වින්දාහ.

වෙසක් උත්සවය ඉතාමත්ම උසස් මට්ටමකින් "අල්වසල්" ක්‍රීඩා භූමියේදී සැමරූ අතර ඒ සඳහා අප දූ පුතුන් ඉතා උනන්දුවෙන් සහභාගී වූහ.

නත්තල් දිනය සැමරීමේ වටිනාකම දරුවන්ට පෙන්වාදීමට තවත් කුඩා නත්තල් උළෙලක් සංවිධානය කල අතර "නත්තල් සීයා" සහ "නත්තල් නස" ලමුන්ගේ විශේෂ සතුටට හේතු විය.

## විනෝද චාරිකාව

බාහිර ක්‍රියාකාරකම්වල නිරතවීමෙන් ළමයින්තුළ අන්‍යොන්‍ය සම්බන්ධතාවය හොඳ නැංවීමටත්, අපේ කම, එකමුතු කම ඇතිකරීමටත් ඔවුන්ට නිදහසේ විහිද ගිය පරිසරයක් තුළ පැය කිපයක් හෝ සතුටු වීමට ඉඩ ලබාදීම සඳහා ඉතා කෙටි විනෝද චාරිකාවක් සංවිධානය කෙළෙමු. ඉතා විනෝදකාමී පැය කිපයක් අපි එහි ගත කෙළෙමු. දරුවන්ගේ සතුට අපේ සතුටට හේතු විය. කඹ ඇදීම, එච්චන් ඇල්ලීම, ඉඩු පැනීම වඩාත් සිත් ගත් අංග විය.



## පාසැල් සමිතිය

ළමයින්ගේ කියවීමේ,ලිවීමේ මෙන්ම ඉදිරිපත්වීමේ ශක්තිය දියුණු කරනු පිණිස මෙම වසරේ සිට සෑම මාසයකම අවසාන සිකුරාදා "අපේ උරුමය" වෙනුවට පාසැල් සමිති වාරයක් පැවැත්වීමට අපි තීරණය කෙළමු. එදිනට පියවීම සිසුන් දහවල් 12.00 ට රැගෙන යාමට පැමිණෙන මෙන් දෙමාපියන්ගෙන් ඉතා කාරුණාවෙන් ඉල්ලා සිටිමු.

මංගල රැස්වීම ජනවාරි 31 වැනි දින පැවැත්වූ අතර දරුවන් තුළින්ම නිලධාරි මණ්ඩලය පත්කර ගත් අතර අනුශාසකවරු වශයෙන් ගුරු මණ්ඩලය ඔවුන් සමග නිරතුරුවම රැඳී සිටී. පළමු රැස්වීම ඉතා සාර්ථක එකක් වූ අතර එදා ඔවුන්ගේ ඉදිරිපත්වීම නිසාම මෙවර නිදහස් උළෙල ඔවුන්ගෙන්ම එකක් කිරීමට අපි තීරණය කෙළෙමු. සතියක කෙටි කාලයක් තුළ එම උත්සාහය මල්පල ගැන්වීමට ඔවුන් ගත් ප්‍රයත්නය අපි ඉතා අගය කරමු.

***රටක, දැයක එගකීම දෝතපුරා පිළිගැනීමට බලාපොරොත්තුවන ඔවුන්ට අපේ සුබ පැතුම්!***



## චිත්‍ර තරඟයට සහභාගී වීම

ශ්‍රී ලාංකික සිසු දරු දැරියන් වෙනුවෙන් අබුඩාබි සංස්කෘතික පදනමේ මෙහෙයවීමෙන් පැවැත්වෙන චිත්‍ර තරඟය සඳහා ළමයින් සහභාගි කරවිය හැකි බව විද්‍යුත් තැපෑල මගින් දැනගත් අතර ඒ බව දෙමව්පියන්ට ලිඛිතව දන්වා යවන ලදී.

ළමයින් 50 ක් ඒ සඳහා ජනවාරි 2 වැනි දින අබුඩාබිය වෙත රැගෙන ගිය අතර එහිදී සිය කුසලතාවයන් පෙන්වීමෙන් ජනවාරි 25 වැනි දින පැවැත්වූ ප්‍රදර්ශණයේදී විශාල ජයග්‍රහනයක් ලබා ගැනීමට අපේ දූ පුතුන් සමත් වූහ. ළමයින් උනන්දු කරවූ සහ අප සමග අබුඩාබි යාමට එක්වූ සියළුම දෙමාපියන්ට අපේ ප්‍රණාමය.









## නව ගොඩනැගිල්ලට ගෙවැදීම

කොන්සල් ජනරාල් තුමාගේත් එම මැතිණියගේත් ප්‍රධානත්වයෙන් පසුගිය පෙබරවාරි 7 වැනි සිකුරාදා දිනට යෙදුනු සුභ මොහොතින් පෙල සිරිතට අනුව කිරි ඉතිරවීමෙන් නව ගොඩනැගිල්ල විවෘත කරන ලදී.

මෙය අප ලැබූ විශාලම ජයග්‍රහණයයි. කොන්සල් ජනරාල් තුමාගේ පූර්ණ අනුග්‍රහයත්, ඔබ සැමගේ නොමසුරු ආධාරයත්, අපගේ ධෛර්යයත් දම්වැලක පුරුක්සේ එකට එක්වූ හෙයින් එම සතුට සියල්ලන් සමග එක්ව විඳ ගැනීමට අපි සමත් වීමු.

පාසැල් සිසු දරු දැරියන්ගේත්, ගුරුවරුන්ගෙත්, දෙමව්පියන්ගේත් උපකාරය මත එම නිදහස් භූමියේම අපේ දැයේ 55 වැනි නිදහස් උළෙල උත්සවාකාරයෙන් පැවැත්වීමු. හද ගැහෙන රාවයෙන් අපි එම නිදහස සැමරුවෙමු. එදින උත්සවයේ සාර්ථකත්වයට අතහිත දුන් සැමට අපගේ ප්‍රණාමය.



## පාසැල් පුස්තකාලය

සිසු දරුදැරියන් අතර සිංහල පොත පත කියවීමේ රුචිය ඇති කරවනු පිණිස අපි කුඩා පුස්තකාලයක් ආරම්භ කෙලෙමු. සතියකට වරක් අළුත් පොත් ලමුන්ට ලබා දෙන අතර පිරිසිදුව, පොත් ආරක්ෂාකර නැවත භාර දෙන මෙන් කරුණාවෙන් ඉල්ලා සිටිමු.

පුස්තකාලය වැඩි දියුණු කර ගැනීම පිණිස පාසැල් නිවාඩුව සඳහා ලංකාවට ගොස් පැමිණෙන විට එක් ලමයෙකු වෙනුවෙන් අඩුම තරමින් පොත් දෙකක් වත් රැගෙනවිත් අපවෙත භාරදෙන මෙන් ඉල්ලා සිටිමු.

# අනගි පින්කමක්

එක්සත් අරාබි එමිරයේ වෙසෙන ශ්‍රී ලාංකික ජනතාවට සෙත් පතා අපගේ නව ගොඩනැගිල්ලේ පසුගිය මාර්තු 6-7 දෙදින තුල ඉතාමත් උත්කර්ෂවත් අන්දමින් සර්වරාත්‍රික පිරිත් දේශනයක් පැවැත්වීමු.

මහා සංඝයා වහන්සේලා හය නම ශ්‍රී ලංකාවේ සිට වැඩම කල අතර ඉතාමත් වටිනා පින්කමකට සහභාගිවීමට අපි සියළු දෙනාම වාසනාවන්තයෝ වීමු.

සංස්කෘතික අධ්‍යාපන කේන්ද්‍රයේ කමිටු සාමාජික සාමාජිකා මහත්ම මහත්මීනුත්, ආචාර්ය මණ්ඩලයත් ඉතාමත් උනන්දුවෙන් සිය කාලය, ශ්‍රමය කැපකල අතර එහි වටිනාකම පින්කම තුලින් මොනවට පැහැදිලි විය.

පාසැල් දරුවන් සියළු දෙනාම පින්කමට සහභාගි වූ අතර ඔවුන්ගේ පෙරහැර සිත් ගන්නාසුළු විය. බෞද්ධ සංස්කෘතියේ අනගිතම අවස්ථාවක් සියැසින් දැක බලා ගන්නට අපේ දරුවන්ට මෙයින් හැකිවිය.

*තවද උත්සවය සාර්ථක කර ගැනීම පිණිස අප සමග අත්වැල් බැදගත් සියළුම දෙමව්පියන්ටත්, දානමානාදී කටයුතු වලට එකතුවූ සියළුම පිරිසටත්, පැමිණ සිටි සියළුම දෙනාටත් අපගේ ප්‍රණාමය පුද කිරීමට මෙය අවස්ථාවක් කර ගනිමු.*





## ආරාධනා

ඔබෙන් ලැබෙන චෝදනා, යෝජනා සියල්ල අප නිරතුරුවම අගය කරන අතර අප සමග රැඳී සිටිමින් අධ්‍යාපන කේන්ද්‍රයේ සාර්ථකත්වය රැක ගැනීමට අත්වැල් බැඳ ගන්නා ලෙස දෙමාපිය ඔබ සැමට ආරාධනා . . .

## ගෙදර වැඩ

දරුවන් වෙත අධික වැඩ කොටසක් පැවරීමෙන් ඔවුන් පාසැලට පැමිණීමේ උනන්දුව නැති කිරීමට බලාපොරොත්තු නොවන නමුත් සතියේ එක් දිනක විනාඩි 15 ක පමණ කාලයක් ඔවුන් සමග රැඳී සිටිමින් සිංහල භාෂාව ලිවීමට සහ කියවීමට දරුවන් දිරිමත් කරන මෙන් ඔබගෙන් ඉල්ලා සිටිමු.

## හදිසි වියෝවක්

අධ්‍යාපන කේන්ද්‍රය ආරම්භයේ සිටම ආචාර්ය වරයෙකු වශයෙන් සේවය කල විජේසිරි මහතා හදිසියේම අප අතරින් පසුගියදා වියෝවිය. ඔහු වෙනුවෙන් අප පාසැල් දරු දැරියන් හා දෙමාපියන්ගේ සහභාගිත්වයෙන් පින්කමක් පවත්වා ඔහුට නිවන් සුව ප්‍රාර්ථනා කෙලෙමු.



# ගුරුවර සංකල්පනා

තද හිරු රැසින් තැහැවූ
වැලි සුළං හමායන කර්කශ වූ
නුහුරු නුපුරුදු දේශයක

සුදෝසුදු ජාතික ඇඳුමින් සැරසී පාසැල වෙත
පිය නගන දරු දැරියන්ගේ මිහිරි දසුන බලා
අප ලබන ප්‍රීතිය කෙසේ නම් විස්තර කරමුද?

ගලායන ගංගා, ඇද හැලෙන දියඇලි,නිල්ල පිරුණු කුඹුරු යාය, කුරුලු හඬින් විකසිත වූ මාදං බෝවිටියා පඳුරු, කඳුගැට වෙලාගත් මීදුම් පටල, හමන මදනලද සමගින් ගත දැවටෙන සිහිලස මේ සියල්ල සංකලනයෙන් අප ලැබූ,

අපේ උරුමය
අපේ සංස්කෘතිය
අපේ භාෂාව
අපේ කම

මෙම දරුවන්ට ලබා දීමට අප කරන උත්සාහය සාර්ථක වනු සහතිකය.

ඒදිනට සතුටු කඳුළු පිසලා අපි ගයන්නෙමු මෙසේ . . .

අපට රටක් ඇත පුතුනේ . . .

අපට දැයක් ඇත පුතුනේ . . .

කුමක් කලත් කොහේ ගියත් . . .

උරුමය නුඹටයි පුතුනේ . . .

# උත්සාහය

අපේ පාසැල පුංචි පාසැලක් නොවේ. දැන් එහි ඉගෙනුම ලබනට ලියා පදිංචි වූ දූ පුතුන් ගණන 215 ක් පමණ වේ. සිය කැමැත්තෙන්ම ඉගැන්වීම කරන ගුරුවර ගුරුවරියන් 11 දෙනෙකි. සිය බාල කාලයේ පාසැලෙන් පන්සලෙන් මෙන්ම පරිසරය තුලින් ඔවුන් තම ජීවිත වලට එක් කරගත් සියළු සාර ධර්මයන්ද ගුණ නුවන ද ඩුබායි ඇතුළු උතුරු එමීරයන්හි වෙසෙන අපේම දූ පුතුන්ගේ ජීවිත වලටත් කාන්දු කරවනු වස් ඔවුන් දරන්නේ අප්‍රමාණ වූ වෙහෙසකි. එහෙත් තමන්ගේ ජාතියට තමන් අතින් ඉටුවිය යුතු ඒ යුතුකම ඔවුන් ඉටු කරන්නේ අප්‍රමාණ වූ භක්තියකිනි.

සංවිධායක කමිටුව ඇතුළු ගුරු මණ්ඩලය